**ශීර්ෂය 335 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 335 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ, 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ, මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය  මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා  අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු  නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ අගය රු.44,193,169 ක් ලෙස දක්වා තිබූ අතර, භාණ්ඩාගාරයේ CIGAS වැඩ සටහන යටතේ එම අගය රු.46,619,220 ක් වශයෙන් දක්වා තිබිම හේතුවෙන් රු.2,426,051ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට භාණ්ඩාගාරය මගින් කටයුතු කරනු ඇති බව. | භාණ්ඩාගාරයේ අගයන් සමඟ සැසදෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ඇප ලේඛනය<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඇප තැන්පත් ලේඛනයක් ඉදිරියේ දී පවත්වාගෙන යාම සඳහා කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) උප පත්‍රිකා පොත් ලේඛනය<br>මුදල් රෙගුලාසි 341 ප්‍රකාරව උප පත්‍රිකා ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | උප පත්‍රිකා පොත් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කෙරෙමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු වැය විෂයය සඳහා ප්‍රතිපාදිත මුදලින් සියයට 98 ක් ඉතිරි වී තිබුණි. | ගොඩනැගිලි අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු ගොඩනැගිලි හිමිකරු පාර්ශවය විසින් සිදු කර දෙන අතර, ගොඩනැගිලි බදු කුලිය මගින් මෙම වියදම් ආවරණය වන බැවින් මෙම වැය විෂයෙහි ප්‍රතිපාදන ඉතිරි වූ බව. | හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

## 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කවයක් පිහිටුවා, අවශ්‍ය පියවර ගැනීමට වර්ෂ 2021 දී කටයුතු කර ඇතත්, වර්ෂ 2022 තුළ ඇති වූ ඉන්ධන හිඟය, කඩින් කඩ සේවයට වාර්තා කිරීම වැනි බාධාවන් හේතුවෙන් සක්‍රියව පවත්වාගෙන යාමට නොහැකි වී ඇත. මේ වනවිට, එකී ක්‍රමවේදය සක්‍රියව පවත්වාගෙන යාමට පියවර ගෙන ඇත. අදාළ සමාලෝචන වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කෙරෙමින් පවතින බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | වර්ෂ 2022 තුළ රටතුළ ඇති වූ ඉන්ධන හිඟය, කඩින් කඩ සේවයට වාර්තා කිරීම ආදී බාධාකාරී තත්ත්වයන් උද්ගත වීම හේතුවෙන් විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වාර එකක් පමණක් පැවැත්වීමට හැකි වී ඇති බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3:1 වගන්තිය. | කොමිෂන් සභාවට අයත් වාහන 06ට අදාළව චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සංචිත වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් ක්‍රමානුකූලව සිදු කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතින බව. | චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතුය. |

### 2.4 අනුමත නොකළ ගෙවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිත්‍ය තනතුරට හිමි වැටුප් හා දීමනාවලට අමතරව ද්විතියික දීමනාව වශයෙන් 2021 වර්ෂයේ රු.42,428 ක් හා 2022 වර්ෂයේ රු.353,455ක් වශයෙන් එකතුව රු.395,883 ක් ගෙවා තිබූ නමුත් එම ගෙවීමට අදාල විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පත්වීම් ලැබූ සියලු ලේකම්වරුන්ට වැටුපෙන් ½ ක ද්විතියින දීමනාව ගෙවා ඇති බව. වර්තමාන ලේකම්තුමිය 2021 ඔක්තෝබර් 29 දින පත්වීම් ලබා පැමිණි අතර මෙම දීමනාව ගෙවීම සම්බන්ධයෙන් ජනාධිපති කාර්යලයෙන් සිදු කළ විමසීමට පිළිතුර ලෙස අදාළ දීමනාව ගෙවීමට හැකියාව පවතින බව දන්වා ඇති බව. | දීමනා ගෙවීම සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම තුල යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර හා වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් සැලැස්ම යනාදී තොරතුරු ඇතුලත් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2023 සඳහා අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීමට කටයුතු කරන ලද බව. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 21 වන සියවසට සරිලන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් සිදු කිරීමට අදාළ වැඩපිළිවෙල සඳහා වසර 30ක් පමණ පැරණි කොමිෂන් සභා පනත සංශෝධනයකර පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසය වනවිට සැලසුම් කර තිබුණද පනතේ නිර්දේශිත සංශෝධන 2022 ඔක්තෝම්බර් 05 වන දින අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම පමණක් සිදුකර තිබුණි. | කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම පිණිස සකස් කරන ලද කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | සැලැසුම් ප්‍රකාරව පනතේ සංශෝධනයන් සිදුකළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකාවේ විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරුවිද්‍යාව, සෞන්දර්ය, ගණිතය (STEAM) අධ්‍යාපනය පිළිබඳ පිළිගත් ප්‍රතිපත්ති ලේඛනයක් සැකසීමට සමාලෝචිත වර්ෂයේ ජූනි 30 දින වනවිට සැලසුම් කර තිබුණද, 2022 දෙසැම්බර් මාසයේදී ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පවත්වන ලද අධ්‍යාපනය පිළිබඳ පළමු ද්විපාර්ශවික ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණයට පර්යේෂණ පත්‍රිකාවක් පමණක් ඉදිරිපත් කර තිබුණි. | වර්ෂ 2022 දී ඇති වූ විවිධ බාධාකාරී තත්ත්වයන් යටතේ කාර්යය ඉටු කිරීම ප්‍රමාද වුව ද පර්යේෂණයේ අවසන් වාර්තාව පිළියෙල කෙරෙමින් පවතින බව. | සැලැස්මෙහි සඳහන් ක්‍රියාකාරකම් අපේක්ෂිත පරිදි ඉටු කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2022 අගෝස්තු මාසය වන විට ශ්‍රී ලංකාවේ ගුරු වෘත්තීයකරණය සඳහා ගුරු අධ්‍යාපනය පිළිබඳ නිර්දේශිත ජාතික උපාය මාර්ගික රාමුවක් සැකසීමට සැලසුම් කර තිබුණද වර්ෂය අවසාන වන විටත් එම කාර්යය සඳහා දත්ත එකතු කිරීම සිදු කරමින් පැවතුණි. | වර්ෂ 2022 දී ඇති වූ විවිධ බාධාකාරී තත්ත්වයන් යටතේ කාර්යය ඉටු කිරීම ප්‍රමාද වුව ද පර්යේෂණයේ අවසන් වාර්තාව පිළියෙල කෙරෙමින් පවතින බව. | සැලැස්මෙහි සඳහන් ක්‍රියාකාරකම් අපේක්ෂිත පරිදි ඉටු කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඈ) | පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණද ඒ සම්බන්ධ නිබන්ධනයක් පර්යේෂණ සමුළුවට ඉදිරිපත් කිරීම පමණක් සිදුකර තිබුණි. | වර්ෂ 2022 දී ඇති වූ විවිධ බාධාකාරී තත්ත්වයන් යටතේ කාර්යය ඉටු කිරීම ප්‍රමාද වුව ද පර්යේෂණයේ අවසන් වාර්තාව පිළියෙල කෙරෙමින් පවතී. අධීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීමේ කාර්යය වර්ෂ 2024 දී සිදු කිරීමට සැලසුම් කර ඇති බව. | සැලැස්මෙහි සඳහන් ක්‍රියාකාරකම් අපේක්ෂිත කාලය තුළ දී නිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පූර්ව පාසල් අධ්‍යාපනය, ප්‍රාථමික, ද්විතීක, තෘතියීක, උසස්, නොවිධිමත්, වැඩිහිටි, විශේෂ, වෘත්තීය සහ ආගමික අධ්‍යාපනයන් මෙන්ම සිසුන් ඇතුළත් කර ගැනීම, ගුරුවරුන් බඳවා ගැනිම සහ වෘත්තීය සංවර්ධනය, අධ්‍යාපනයේ සංයුතිය සංවර්ධනය කිරීම, තක්සේරුව සහ ඇගයීම, අධ්‍යාපන සම්පත් සහ සහයක සේවාවන් ආදී බහු විධි ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 1992, 2003, 2016 හා 2018 යන වර්ෂ වලදී ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කර තිබුණද වර්තමානය දක්වාම ක්‍රියාත්මක තත්වයේ නොපැවතුණි. | ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ප්‍රධාන ක්ෂේත්‍ර 8ක් ආවරණය වන පරිදි සකස් කරන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව 2020-2030 අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ජනාධිපතිවරයා වෙත පිළිගන්වන ලද අතර ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි කැබිනට් මණ්ඩල අනු කමිටුවක් හරහා අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීමට කටයුතු කෙරෙමින් පවතින බව. | අපේක්ෂිත පරිදි අරමුණු ළඟා කර ගැනීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවෙහි නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විධිමත් නොවන අධ්‍යාපන වැඩසටහන් පිළිබඳව පිළිගත් ප්‍රතිපත්ති ලේඛනය සහ වත්මන් වැඩසටහන් සකස් කිරීම සඳහා පවතින යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම 2022 සැලස්මට ඇතුලත් කර තිබුණද එය නැවතත් 2023 වර්ෂයට ඇතුලත් කර තිබුණි. | එකඟ වෙමි. | සැලැස්මට අනුව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | පිරිවෙන් සිසුන්ගේ උපදේශන සහ මාර්ගෝපදේශ අවශ්‍යතා පිළිබඳව පර්යේෂණ, සොයාගැනීම් 2022 සැලසුමට ඇතුලත් කර තිබුණද අධ්‍යයන කටයුතු වල අධික බර හේතුවෙන් එය 2023 වර්ෂයට ඇතුලත් කර තිබුණි. | එකඟ වෙමි. | සැලැස්මට අනුව කටයුතු කිරීමට හැකි පියවර ගත යුතුය. |

## 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ මුදල් ආදියේ භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් මු.රෙ. 315 විධිවිධාන යටතේ සභාවේ නිලධාරීන් 04 දෙනෙකුගෙන් ඇප තැන්පත් කර ගැනීමට ගණන් දීමේ නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මු.රෙ. 880 ප්‍රකාරව රජයේ මුදල් ආදායම, මුද්දර හෝ බඩු භාරව සිටීම එසේ නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබූ ඇති නිලධාරීන්ද රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැන්පතු තැබිය යුතු වුවත් එකී කටයුතු වලට සම්බන්ධ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිලධාරීන් ඇප තැන්පතු තබා නොතිබුණි | මු.රෙ. 880 ප්‍රාකරව ඉදිරියේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.5 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ආයතනික කාර්ය මණ්ඩලය 30 ක්ව සිටියදී කාර්යාලය පවත්වාගෙන යාම සඳහා බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ වර්ග අඩි 4748 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි කුලී වශයෙන් රු.15,727,424 ක්ද වාහන පහසුකම්, සනීපාරක්ෂක හා පිරිසිදු කිරීම්, විදුලි බිල හා ජල බිල සඳහා රු.2,991,240 ක්ද ඇතුළත්ව සමාලෝචිත වර්ෂය තුළ දී රු.18,718,664 ක් ගෙවා තිබුණි. | මෙම ආයතනය අඩු කුලී වියදමක් සහිත වෙනත් සුදුසු ස්ථානයක ස්ථාපනය කරගන්නා තෙක් බ.ජා.ස. ශාලා පරිශ්‍රය තුල ලබාගෙන ඇති වර්ග අඩි 4748 ක ප්‍රමාණයෙන් වර්ග අඩි 1000කට ආසන්න ප්‍රමාණයක් ආපසු භාර දීමට කටයුතු කරන ලද අතර ඒ අනුව වර්ෂ 2023 බදු කුලී ගිවිසුම සංශෝධනය කෙරෙමින් පවතින බව. | ආයතන පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිලි සපයා ගැනීමේදී අරපිරිමැසුම්දායක ලෙස කටයුතු කිරීමට වගබලා ගත යුතුය. |

**4. යහපාලනය**

**4.1 විගණන හා කළමනාකරණ කමිටුව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියට අනුකූල නොවන පරිදි කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව 2020-2023 වාර්තාව අතිගරු ජනාධිපතිතුමා වෙත 2022 දී ඉදිරිපත් කළ අතර, එහි ප්‍රගතිය සාකච්ඡා කළහැකි වීම අත්‍යවශ්‍ය කර්තව්‍යයක් වූ බැවින් 2022 පළමු හා දෙවන කාර්තුව සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නොපැවැත්වීමට කමිටු සාමාජිකයින් තීරණය කරන ලද බව. | පනත ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. |